චක්‍රලේඛ අංක : 20 /2013

මාගේ අංක : කේ05/5/විවිධ/ /2013
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2013.05. 10 වන දින .

සියළුම සහකාර බන්ධනාගාර අධිකාරීන්
සහ සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත

**බන්ධනාගාර ආයතන තුලට පිටස්තර පුද්ගලයින් ඇතුල්වීම**

බන්ධනාගාර ආයතන තුල විවිධ උත්සව අවස්ථා , රූගත කිරීම් , නැරඹීම් හා වෙනත් අවශ්‍යතාවයන් සඳහා බන්ධනාගාර ආයතන තුලට විවිධ පුද්ගලයින් මාගේ පූර්ණ අනුමැතියකින් තොරව ඇතුල් වන බවට වාර්තා වී ඇත .

02. මින් ඉදිරියේදී යම් කිසි අවශ්‍ය තාවයක් සඳහා යම් පුද්ගලයකුට බන්ධනාගාර තුලට ප්‍රවිෂ්ඨ වීමට අවශ්‍ය වන්නේනම් ඔවුන්ගේ අවශ්‍ය තාවය පිළිබඳ ලිපියක් ලබාගෙන පැමිණෙන අයගේ නම ජාතික හැදුණුම් පත් අංකය සඳහන් කර ඔබගේ නිර්දේශය සමග ඉල්ලීම් ලිපිය දින 10 ටවත් පෙර මා වෙත එවා අනුමැතිය ලබා ගැනිමට වගබලා ගත යුතුය .

03. මෙම කටයුතු ආයතන තුල පෙරවරු 9.00 සිට පස්වරු 4.00 දක්වා කාලය තුල පමණක් සිදුකලයුතු අතර ඉන් පරිභාහිරව කටයුතු සිදුවන්නනේම් ඒ සඳහා මාගේ විශේෂ අනුමැතියක් ලබා ගතයුතුය .

04. බාහිරින් පැමිණෙන පුද්ගලයින් විසින් යම්කිසි නිති විරෝධී කටයුත්තක නිරතවුවහොත් මින් ඉදිරියේදී ආයතන තුලට පැමිනීමට නිර්දේශ නොකලයුතු අතර , ඒ සම්බන්ධ විස්තර ඇතුලත් වාර්තාවක් කඩිනමින් මා වෙත එවීමට වගබලාගතයුතුය .

05. අනුමැතිය ලබාදිමේන් පසු පිටතින් පැමිණිමට නියමිත පුද්ගලයින්ගේ සහ භාණ්ඩ වල අනන්‍යතාවය තහවුරු කරගෙන පූර්ණ පරික්ෂාවකින් පසුව බන්ධනාගාරය තුලට ඇතුළුවීමට අවසර ලබාදිය යුතු අතර බන්ධනාගාරය තුලදී ජේලර් වරයකුගේ අධික්ෂණය යටතේ බන්ධනාගාර නිති රිති වලට අනුකූලව කටයුතු සිදුකලයුතුය .

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්